ප්‍රසම්පාදන දැන්වීමයි

මිණිපේ ප්‍රාදේශීය සභාව මඟින් ''පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති'' යටතේ අනුමත අරමුදල් හා ප්‍රාග්ධන වත්කම් නඩත්තු වැඩසටහන යටතේ පහත උපලේඛනයේ සඳහන් ඉදිකිරීම් කර්මාන්ත වෙනුවෙන් යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම් ලත් ලංසු කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

අයිතම අංකය	කර්මාන්තය හා ලංසු අංකය	ඉංජිනේරු ප්‍රමාණපත්‍ර වටිනාකම (වැට් රහිතව) රු.මිලියන	කොන්ත්‍රාත් කාලය	CIDA ලියාපදිංචිය	ලංසු සුරක්ෂණය		ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තුව (රු.)
					ඇපකරයේ වටිනාකම (රු.)	වලංගු විය යුතු දිනය	
01	මිණිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩනැඟිලි සංවර්ධනය කිරීම (CPC/KN/MPS/DEV/04/03 /2025/01/PACKAGE-01 I.මිණිපේ ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ල පිටුපස වාහන නැවැත්වීමේ ස්ථානයක් ඉදිකිරීම II.හසලක සිරිමාවෝ බණ්ඩාරනායක පෙර පාසලේ විශේෂ ක්‍රියාකාරකම් කාමරය ප්‍රතිසංස්කරණය කර ප්‍රවේශ මාර්ගය සහ වැට සකස් කර සංවර්ධනය කිරීම.	4.3	දින 35	CIDA ලියාපදිංචිය C8 හෝ ඉහළ ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් (ගොඩනැඟිලි)	රු.64,500.00	2026.01.23	2,000.00
02	මිණිපේ ප්‍රාදේශීය සභාවට අයත් කසළාංගනය වැඩිදියුණු කිරීම (CPC/KN/MPS/DEV/04/03 /2025/01/PACKAGE-02 I.කසළ අංගනයේ ආරක්ෂිත බැම්ම පුළුල් කිරීම. II.කොම්පෝස්ට් අංගනය පුළුල් කිරීම	6	දින 35	CIDA ලියාපදිංචිය C8 හෝ ඉහළ ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් (ගොඩනැඟිලි)	90,000.00	2026.02.20	2,500.00
03	මිණිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම (CPC/KN/MPS/DEV/04/03 /2025/01/PACKAGE-03 I.බුලත්වැල්කඳුර ජල යෝජනා ක්‍රමයේ ජල ධාරිතාව වැඩි කිරීම සඳහා නව ජල දිගුවක් සංවර්ධනය කිරීම. II.රත්නැල්ල ජල යෝජනා ක්‍රමයේ ජල ධාරිතාව වැඩි කිරීම සඳහා නව ජල දිගුවක් සංවර්ධනය කිරීම	4.3	දින 35	CIDA ලියාපදිංචිය C8 හෝ ඉහළ ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් (ජල සම්පාදන හා මලාපවාහන)	64,500.00	2026.01.23	2,000.00
04	මිණිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම (CPC/KN/MPS/DEV/04/03 /2025/01/PACKAGE-04 I.ඔරුවලයාය ජල යෝජනා ක්‍රමයේ ෆිල්ටර් ටැංකිය වෙත නළ ජලය මඟින් ජල රැගෙන ඒම සහ ඔරුවලයාය සිට පාලම්හන්දිය දක්වා නව ජල දිගුවක් සංවර්ධනය කිරීම	7.9	දින 42	CIDA ලියාපදිංචිය C8 හෝ ඉහළ ශ්‍රේණියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් (ජල සම්පාදන හා මලාපවාහන)	118,500.00	2026.02.20	3,000.00

1. මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය අනුව සිදු කෙරේ.

2. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා වන සුදුසුකම යටතේ පසුගිය වසර 03 තුළ සමාන වටිනාකමින් යුතු හෝ ඊට ඉහළ වටිනාකමකින් යුත් කර්මාන්තයක් හෝ ඊට වැඩි කර්මාන්ත ගණනක් සාර්ථකව ඉටුකර තිබීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ.

3. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු මිණිපේ ප්‍රාදේශීය සභාවේ සභාපති හෝ ලේකම් වෙතින් දුරකථන අංක 055-2257767 විමසා ලබා ගත හැකි අතර, 2025.10.24 වන දින සිට 2025.11.10 දක්වා 9.00 පැය හා 14.30 පැය අතර සතියේ වැඩ කරන දිනයන්හි මිණිපේ ප්‍රාදේශීය සභාවේ දී ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

4. එක් එක් ලංසුවකට ආපසු ගෙවනු නොලබන ඉහත වගුවේ සඳහන් ගාස්තුව මුදලින් මිණිපේ ප්‍රාදේශීය සභාවේ සරප් වෙත ගෙවීමෙන් අනතුරුව අදාළ ලදුපත හා ලිඛිත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර, 2025.10.24 වන දින සිට 2025.11.10 දින දක්වා 9.00 පැය හා 14.30 පැය අතර මිණිපේ ප්‍රාදේශීය සභාවේ සභාපති වෙතින් උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

5. ලංසුවේ වටිනාකම රුපියල් මිලියන 05 ඉක්මවන අවස්ථාවන්හිදී කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු විසින් 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනතේ 8 ඡේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය

6. ඉහත වගුවේ සඳහන් වටිනාකමට ‘‘මිණිපේ ප්‍රාදේශීය සභාව’’ නමින් එම වගුවේ සඳහන් කර ඇති දිනය දක්වා වලංගු වන පරිදි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක (ශ්‍රී ලංකා මහ බැංකු විසින් අනුමත කරන ලද) දේශීය/ විදේශීය වාණිජ බැංකුවකින් හෝ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) මගින් හෝ ලබාගත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම හෝ ලංසු සුරක්ෂණය මුදලින් තැන්පත් කරන්නේ නම් ඉහත වගුවේ සඳහන් මුදල මිණිපේ ප්‍රාදේශීය සභාවේ සරප් වෙත තැන්පත් කර එම ලදුපත ඉදිරිපත් කිරීම කළ යුතුය.

7. ලංසු ලේඛන මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් පිළියෙලකර වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙකම එක් කවරයක නැවත බහා මුද්‍රා තබා ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ කොන්ත්‍රාත්වේ නම හා කොන්ත්‍රාත් අංකය යොදා, 2025.11.11 දින 14.30 පැය හෝ ඊට පෙර ලැබෙන පරිදි “සභාපති, මිණිපේ ප්‍රාදේශීය සභාව,හසලක” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් මිණිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුයි. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරන බැවින් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය පවරනු ලබන නියෝජිතයින්ට ඒ සඳහා සහභාගී විය හැක.

8. මේ සම්බන්ධව වැඩිදුර විස්තර සඳහා පූර්ව ප්‍රසම්පාදන රැස්වීමක් 2025.11.03 දින පෙ.ව 11.00ට මිණිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වේ. ඒ සඳහා ලංසුකරුට හෝ ලංසුකරුගේ නියෝජිතයකුට සහභාගි විය හැක.

9. ඉදිරිපත් කරන ලද ලංසු සම්පූර්ණයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ කොටසක් පිළිගැනීම හෝ පිළිබඳ සම්පූර්ණ අයිතිය මිණිපේ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

10. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර මිණිපේ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ 055-2257767 දුරකතන අංකය අමතා ලබා ගත හැකිය.

බී.එම්.ආර්.බී.ගුණරත්න,
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
මිණිපේ ප්‍රාදේශීය සභාව, හසලක.

දිනය : 2025.10.22

දුරකථන අංකය- 055-2257767

Email – psminipe@gmail.com